9 වසර

## ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම.

ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණයේදී උපයෝගී කරගත හැකි මූලාශ්‍ර වර්ග කිහිපයක් යටතේ සාකච්ඡා කළ හැකිය.

- වංශ කතා
- රූකම්
- සෙල්ලිපි
- සන්දේශ කාව්‍යය
- සාහිත්‍ය කෘති
- දේශ සංචාරකයින්ගේ වාර්තා

ඉහත මූලාශ්‍ර යටතේ සෙල්ලිපි / සංදේශ කාව්‍ය ඇසුරින් නර්තන කලාව පැවති බවට සාධක කිහිපයක් හඳුනාගත හැකිය.

| යුගය | මූලාශ්‍රය | සාධක |
|---|---|---|
| අනුරාධපුරය | සෙල්ලිපි ලෙන් ලිපි | * ක්‍රි: ව: 1 - 2 සියවස්වලට අයත් සැස්සේරුව සෙල්ලිපියේ<br>• නාටක ගණපතියා විසින් පවරා දෙන ලදී යනු-වෙන් සඳහන් වේ.<br>• කොරවක්ගල ලෙන් ලිපිය<br>• නාටක ගණපතියාගේ දුව විසින් පවරා දෙනලදී යනුවෙන් සඳහන් වේ.<br>• මෙහි "ගණපතියා" යනුවෙන් දැක්වෙන්නේ නැටුම් පරම්පරාවක් සිටි බවයි. |
| පොළොන්නරුව | සෙල්ලිපිය. | * පාලමොට්ටායි සෙල්ලිපිය<br>• මෙම සෙල්ලිපිය අනුව දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටූ බවත් ලංකාව සොළීන්ට යටත්වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වීම ආරම්භ වූ බවත් පෙනේ. මෙම ලිපියට අනුව පාළලෙහි කළනුත්තු නම් දේවදාසින් හත් දෙනෙකු විදූ බවත් ඔවුන්ට නැටුම්වලට කල මුදලකින් කාසි ගෙවූ බවත් කියැවේ.<br>* කාලිංග වංශයේ නාටක ශ්‍රී බලා වැඩ හිඳිනා සිංහාසනයයි. යනුවෙන් කාලිංග වංශෝත්තමයේ ගල් ආසන ලිපියෙහි සඳහන් වේ. |
| ගම්පොළ | සන්දේශ කාව්‍යය. | • තිසර සන්දේශය.<br>• තිසර සන්දේශ කාව්‍යය 14 වැනි සියවසේ ලියන ලද බව පිළිගැනේ. මෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.<br>• තාලම් කලබෙර කම්මැට්ටම පන්තිරි කම රූ<br>තබ මේ ඩැක බෙර බොම්බිලි වීණා මිහිරි සුසි රූ<br>බෙර මද්දල කාහලම් රඹු තිගලම් බඳ සොඳු රූ<br>මෙසියල් වන ශබ්දයෙන් පිළ සෙරෙවින් සිදු අසූ රූ<br>• පිලුපුල් දිගැසි තුනු රන්න කලසී<br>තිදු ලියා සදිසි සියුමැලි දිගැ සී<br>රඟ බැසි පොළසී රඟදෙනා පිල සී<br>දුමු සම විගසී මද පෙම ඇවි සී. |

| යුගය | මූලාශ්‍රය | සාධක. |
|---|---|---|
| කෝට්ටේ | සන්දේශ කාව්‍ය | • සැළලිහිණි සංදේශය.<br>• විදෙන මෙලෙන නරුඹර පුළුලුකුල රැඳී<br>හෙළන හසන අඟ නුවනග බැලුම් විදී<br>රැඳින දිලෙන අබරණ කැළුම ගත සෙදී<br>සැලෙන වනන සිය වැනි රඟන ලිය සැදී<br><br>• ලකල පුළුලුකුල බැඳි මිහිරි මෙවුල් ලා<br>සමග රන් සලඹ රුවු දී වෙමුල් ලා<br>වයන පදට නබමින් පද කමල් ලා<br>රඟන ලඳුන් බල රූ සිරි සියල් ලා<br><br>• පරෙවි සන්දේශය.<br>• මෙළඳුන් හව භාව තලුවන් නා දේ<br>නබමින් තිවරද මද්දල නා දේ<br>ගයමින් නානා ගීයෝර් කී දේ<br>අලහත් රඟ පුවුවන් සිත පෑ දේ<br><br>• ලෙළෙනා දිඳු තොත තිලුපුල සේයා<br>මෙල නවනින් රන් ලිය විල සේයා<br>නළඟනා රඟනා දැක තොල සේයා<br>නළඟනා නුවනත රඟ සල සේයා. |

සැමරුම. ( මෙම සටහන ඔබේ තර්කනය නොහේ සටහන් කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(4)

(1) තර්කන කලාව නැවත බවට සන්දේශ කාව්‍ය ඇසුරින් උදාහරණ 02ක් දෙන්න.

(2) සාහිත්‍ය කෘතියක් ලෙස සංදේශ කාව්‍ය අගයමින් ඔබේ අදහස් දක්වන්න.

(3) "නාල මොට්ටායි" සෙල්ලිපිය ඇසුරින් තර්කන කලාව නැවත ආකාරය විස්තර කරන්න.

(4) සන්දේශ කාව්‍යයන්හි සිටින කවියන නාද මාලාව, කාල ලක්ෂණ, කාව්‍ය අර්ථය ඇසුරු කරමින් කෙටි තර්කනයක් ප්‍රායෝගාත්මකව ඉදිරිපත් කිරීමට පුහුණු වන්න.